**ලංකා බැංකුව - 2015**

------------------------------

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශන, විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන හා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත ලංකා බැංකුවේ ("බැංකුව") මූල්‍ය ප්‍රකාශන සහ බැංකුව හා එහි පරිපාලිතයන්ගේ ("සමූහය") ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදු කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලී වරලත් ගණකාධිකාරි සමාගමක් මට සහාය විය. පරිපාලිතයන්ගේ මූල්‍ය ප්‍රකාශන අදාළ පරිපාලිතයන්හි සාමාජිකයන් විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරි සමාගම් විසින් විගණනය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවට අනුව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**1.2 බැංකුව සඳහා විශේෂ ව්‍යවස්ථාපිත විධිවිධාන**

---------------------------------------------------

1971 අංක 38 දරන මුදල් පනතේ 5(1) වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව, 1992 මැයි 14 දිනැති අංක 715 දරන රජයේ ගැසට් පත්‍රයෙහි පළකරන ලද එවකට මුදල් අමාත්‍යවරයාගේ නියෝගය පරිදි එකී මුදල් පනතේ 11 කොටසෙහි ඇතුළත් විධිවිධානවලින් බැංකුව නිදහස් කර ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදුව, භාණ්ඩාගාර ලේකම් විසින් ඔහුගේ 1992 අප්‍රේල් 10 දිනැති අංක ඊඒ02/බීසී/බීපී/01 දරන චක්‍රලේඛය මගින් දන්වන ලද පරිදි සියලු භාණ්ඩාගාර හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලින් ද බැංකුව නිදහස් කර ඇත.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

--------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්මේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

-------

මූල්‍ය ප්‍රකාශනවලින්, 2015 දෙසැම්බර් 31 දිනට බැංකුවේ හා සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------------

#### 2.2.1 සමූහයේ මූල්‍ය ප්‍රකාශන හා ඒකාබද්ධ කිරීමේ පදනම

-------------------------------------------------------

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන, දේශීය බැංකු ඒකකය, විදේශීය බැංකු ඒකකය, ඉස්ලාමීය බැංකු ඒකකය හා බැංකුවේ කොටසක් වන විදේශීය මෙහෙයුම්වල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධවීමෙන් සමන්විත වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී ලං මූ වා ප්‍ර/ ශ්‍රී ලං ගි ප්‍ර) අනුකූලව බැංකුවේ, එහි පරිපාලිත සමාගම්වල හා ආශ්‍රිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධවීමෙන් සමූහයේ මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ.

එක් එක් පරිපාලිත සමාගමේ හා ආශ්‍රිත සමාගම්වල 2015 දෙසැම්බර් 31 දිනට හා ඉකුත් වර්ෂය අවසානයට බැංකුවේ ආයෝජනවල තත්ත්වය පහත පරිදි විය.

| **සමාගමේ නම** | **ආයෝජනයේ තත්ත්වය** | | **ආයෝජනයේ ප්‍රතිශතයක් ලෙස හිමිකම** | |
|---|---|---|---|---|
| | **2015** රු.මිලියන | **2014** රු.මිලියන | **2015** | **2014** |
| **පරිපාලිත සමාගම්** | | | | |
| **- මිල ප්‍රකාශිත සමාගම්** | | | | |
| ප්‍රොපටි ඩිවලොප්මන්ට් පීඑල්සී | 860 | 860 | 95.55 | 95.55 |
| ශ්‍රී ලංකා මර්චන්ට් බැන්ක් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී | 2,255 | 2,123 | 74.49 | 72.14 |
| **- මිල ප්‍රකාශිත නොවන සමාගම්** | | | | |
| සීමාසහිත බීඕසී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝට් සර්විසස් (පුද්ගලික) සමාගම | 1 | 1 | 100.00 | 100.00 |
| සීමාසහිත බීඕසී ප්‍රොපටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම | 1,010 | 1,010 | 100.00 | 100.00 |
| සීමාසහිත බීඕසී ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම | 2.5 | 2.5 | 100.00 | 100.00 |
| සීමාසහිත හොටෙල්ස් කළම්බු (1963) සමාගම | 101 | 101 | 99.99 | 99.99 |
| සීමාසහිත මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා ෆයිනෑන්ෂල් සර්විස් සමාගම ** | - | 132 | - | 80.09 |
| සීමාසහිත ලංකා බැංකුව (යුකේ) සමාගම | 2,684 | 2,684 | 100.00 | 100.00 |
| **පරිපාලිත සමාගම් වල මුළු ආයෝජන** | 6,913.5 | 6,913.5 | | |
| අඩු කළා - හානිකරණය සඳහා ප්‍රතිපාදනය | (700) | (700) | | |
| **පරිපාලිත සමාගම්වල ශුද්ධ ආයෝජන** | **6,213.5** | **6,213.5** | | |

| | | | | |
|---|---|---|---|---|
| **ආශ්‍රිත සමාගම්** | | | | |
| **- මිල ප්‍රකාශිත නොවන සමාගම්** | | | | |
| සීමාසහිත ට්‍රාන්ස් නැෂනල් ලංකා රෙකෝඩ්ස් සොලියුෂන්ස් (පුද්ගලික) සමාගම | 20 | 20 | 24.69 | 24.69 |
| සීමාසහිත සී බැන්ක් ඇසෙට් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම | 31 | 31 | 43.36 | 43.36 |
| සීමාසහිත සදර්න් ඩිවෙලප්මන්ට් ෆයිනෑන්ෂල් සමාගම | 25 | 25 | 41.67 | 41.67 |
| සීමාසහිත මිරේකා කැපිටල් ලෑන්ඩ් (පුද්ගලික) සමාගම | 750 | 750 | 40.00 | 40.00 |
| සීමාසහිත ලංකා සිකියුරිටීස් (පුද්ගලික) සමාගම | 42 | 42 | 41.60 | 40.92 |
| **ආශ්‍රිත සමාගම්වල මුළු ආයෝජන** | **868** | **868** | | |
| අඩු කළා - හානිකරණය සඳහා ප්‍රතිපාදන | (25) | (25) | | |
| **ආශ්‍රිත සමාගම්වල ශුද්ධ ආයෝජන** | **843** | **843** | | |
| **මුළු ආයෝජන** | **7,056.5** | **7,056.5** | | |

** සීමාසහිත මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා ෆයිනෑන්ෂල් සර්විසස් හා සීමාසහිත මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා සේවිස් බැන්ක් සමාගම් 2015 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි සීමාසහිත මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් සමඟ ඒකාබද්ධ කරන ලදී.

## 2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල වීම (ශ්‍රී ලං මූ වා ප්‍ර හා ශ්‍රී ලං ගි ප්‍ර)

------------------------------------------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

**(අ) ශ්‍රී ලං ගි ප්‍ර 39 - මූල්‍ය උපකරණ, හඳුනා ගැනීම හා මැනීම -**

හානිකරණය වූ ණය මත පොලී ආදායම සඵල පොලී අනුපාතය මත හඳුනා ගත යුතුය. කෙසේ වුවද ප්‍රමිතියේ අවශ්‍යා පරිදි හානිකරණය වූ ණය මත ආදායම බැංකුව විසින් හඳුනා ගෙන නොතිබුණි. තවද ප්‍රායෝගිකව ශ්‍රී ලංකා මහ බැංකුව (ශ්‍රී ලං ම බැ) විසින් දෙන ලද නියෝගයන් ප්‍රකාරව අක්‍රීය ණය මත පොලී ආදායම අත්හිටුවීමට බැංකුව අඛණ්ඩව කටයුතු කර තිබූ අතර අත්හිට වූ ආදායම මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමක් ලෙස පොලී ආදායමට හා ණයවලට එකතු කර තිබුණි.

**(ආ) ශ්‍රී ලං ගි ප්‍ර 24 - සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම් -**

බැංකුවේ ස්වාධීන හා විධායක නොවන අධ්‍යක්ෂවරයකු 2009 වර්ෂයේ සිට සීමිත පුද්ගලික සමාගමක ප්‍රධාන විධායක නිලධාරියා ලෙස (CEO) කටයුතු කරමින් සිටී. එසේ තිබියදී බැංකුව විසින් සිමන්ටෙක් එන්ඩ්පොයින්ට් වයිරස් ආරක්ෂණ මෘදුකාංග (Symantec Endpoint Virus Protection Software) (බලපත්‍ර 5000 ක්) එජඩො 40,000 ක පිරිවැයකට 2015 දෙසැම්බර් 28 දින මෙම සමාගමෙන් මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද මෙම ගනුදෙනුව සමාලෝචිත වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල සටහනක් වශයෙන් හෙළිදරව් කර නොතිබුණි.

### 2.3.2 නොසැසඳූ හා හඳුනා නොගත් වෙනස්කම්

---------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හා ශ්‍රී ලංකා මහ බැංකුව (ශ්‍රී ලං ම බැ) විසින් නිකුත් කරන ලද වාර්තාවේ හෙළිදරව් කරන ලද ශේෂ අතර රු.මිලියන 3.5 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට නොසැසඳුණු ශේෂයන් ලෙස පහත සඳහන් සැසඳීම් විෂයයන් මහ බැංකු සැසඳීම් ප්‍රකාශනයේ දැක්වේ.

(i) 2015 දෙසැම්බර් 31 දිනට නොසැසඳූ ලැබෙන චෙක්පත් ආපසු යැවීම් ශේෂය රු.මිලියන 134.7 ක් විය. කළමනාකරණයේ පැහැදිලි කිරීම අනුව, චෙක්පත් නිශ්කාෂණ ක්‍රියාවලිය පුද්ගලික සමාගමක මැදිහත් වීම මඟින් සිදු කෙරේ. තවද, මෙම සමාගම එම ක්‍රියාවලිය වාර දෙකකදී උදේ සහ සවස් වරුවේ සිදු කරනු ලැබේ. වාර්තාකරණ දිනය අවසානයේ, ලැබෙන චෙක්පත් ආපසු යැවීමේ ප්‍රතිඵලයේ වෙනස්කම් එදිනම බැංකුවේ පොදු ලෙජරයේ හඳුනා ගැනීමට නොහැකි වේ. එබැවින් ලැබෙන චෙක්පත් ආපසු යැවීම පොදු ලෙජරයට පසු දින උදැසන ගලපන අතර එවැනි ශේෂයන් සසඳන දිනයට හිඟ ලෙස දැක්වේ.

ලැබෙන චෙක්පත් ආපසු යැවීම් වටිනාකම, සැසඳීම පිළියෙල කිරීමට පෙර බැංකුවට හඳුනාගත හැකි බව නිරීක්ෂණය විය. කෙසේ වුවද ලැබෙන චෙක්පත් ආපසු යැවීම් මුදල, බැංකුකරුගේ මුදල් ගිණුමේ පසුදින සටහන් කිරීමට පද්ධතිය සකස් කර ඇත.

(ii) 2015 දෙසැම්බර් 31 දිනට බැහැර ගනුදෙනු පත්‍රිකා වලට අදාළ නොසැසඳූ ශේෂ රු.මිලියන 378 ක් වූ අතර විශාල ප්‍රමාණයක ගනුදෙනු හේතුවෙන් මෙම මුදල් බැංකුව එදිනම පොදු ලෙජරයේ ගැලපීම් කරනු නොලැබේ.

**2.3.3 ගෙවිය යුතු හා ලැබිය යුතු ගිණුම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව එජඩො 193,640.90 ක ගෙවිය යුතු මුදල් ප්‍රමාණයන් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කිරීමෙන් තොරව පසුගිය වර්ෂ 5 ක් අවිනිශ්චිත ගිණුම් ශේෂය ලෙස දක්වා තිබුණි. තවද සත්‍ය හිමිකරු පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මුළු හිඟ ශේෂයෙන් සියයට 90 ක් නියෝජනය වන එජඩො 3,597,279.59 ක් වර්ෂ 3 ½ කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(ඇ) ඉරාන බැංකුව විසින් පනවන ලද සම්බාධක හේතුවෙන් ගිණුම් වසා දැමීමේ ශේෂයන් ලෙස නියෝජනය වන අවිනිශ්චිත ගිණුමේ පවතින එකතුව එජඩො 3,743,008.43 ක් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු පරිපාටිය පිළිබඳව බැංකුව විසින් මහ බැංකුවේ උපදෙස් ලබා ගෙන නොතිබුණි.

(ඈ) වෙනත් බැරකම් යටතේ හිමිකම් නොපෑ ගෙවීම් නියෝග, උකස් අතිරික්ත, අක්‍රීය ගිණුම් ඇතුළත් අසම්භාව්‍ය ගිණුම් කිහිපයක් බැංකුව විසින් පවත්වාගෙන යනු ලැබේ. මෙම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 388.9 ක් විය. කෙසේ වුවද වර්ෂ 10 කට වැඩි කාලයක් හිමිකම් නොපෑ මෙම ශේෂ ශ්‍රී ලංකා මහ බැංකුවට මාරු කිරීම සඳහා කාල විශ්ලේෂණ වාර්තාවක් මධ්‍යගතව පවත්වා ගැනීමට බැංකුවට පහසුකම් නොතිබුණි.

**2.3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) ශ්‍රී ලංකා මහ බැංකු (ශ්‍රී ලං ම බැ) නියෝගය අංක 3(6) (V)(ආ) - අවදානම් තක්සේරුව | පරිපාලිතයන් පිළිබඳ අවදානම් කළමනාකරණ තක්සේරුව කාලීනව සිදුකර නොතිබුණි. |
| (ආ) 2009 අංක 03 දරන ශ්‍රී ලංකා මහ බැංකු නියෝගයේ 05 වගන්තිය - විදේශ විනිමය ගනුදෙනු | පහත සඳහන් පරිපාටිවලට බැංකුව අනුකූල වී නොතිබුණි.<br><br>(i) භාණ්ඩාගාර සීමාවන් පිළිබඳ විස්තරාත්මක ක්‍රමික සමාලෝචනය<br><br>(ii) භාණ්ඩාගාර මූල්‍ය සීමා සමඟ සම්බන්ධ වීම.<br><br>(iii) මූල්‍ය සංක්‍රමණයට පෙර සීමා නියාමනය නොකිරීම.<br><br>(iv) ක්‍රියාවලි සඳහා බැහැරවීම් සීමා සඳහා අදාළ අනුමැතීන් ලබාගැනීම.<br><br>(v) භාණ්ඩාගාර මධ්‍ය කාර්යාලය විසින් සීමා නියාමනය නොකිරීම. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමූහයේ මෙහෙයුම්වලින් සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 25,490 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වාර්තා කර තිබූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු.මිලියන 21,431 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.මිලියන 4,059 ක හෙවත් සියයට 18.9 ක වර්ධනයක් දැක්වුණි. සමාලෝචිත වර්ෂය තුළදී පරිපාලිතයන් හැර බැංකුවේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.මිලියන 25,279 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු.මිලියන 20,291 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.මිලියන 4,988 ක හෙවත් සියයට 24.6 ක වර්ධනයක් දැක්වුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා බැංකුවේ හා සමූහයේ විවිධ අදියරයන්හි මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සාරාංශයක් පහත වගුවෙහි දැක්වේ.

| | බැංකුව | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|
| | **2015** | **2014** | **වෙනස්වීම** | **2015** | **2014** | **වෙනස** |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **(%)** | **රු.මිලියන** | **රු.මිලියන** | **(%)** |
| පොලී ආදායම | 114,159 | 107,394 | 6.29 | 118,498 | 111,951 | 5.85 |
| පොලී වියදම | (66,419) | (68,944) | (3.66) | (68,381) | (71,197) | (3.96) |
| **ශුද්ධ පොලී ආදායම** | 47,740 | 38,450 | 24.16 | 50,117 | 40,754 | 22.97 |
| **ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම** | 7,838 | 8,100 | (3.23) | 8,082 | 8,324 | (2.90) |
| වෙළඳාමෙන් ශුද්ධ වාසිය | 3,968 | 4,860 | (18.35) | 3,985 | 5,038 | (20.90) |
| මූල්‍ය ආයෝජනයෙන් ශුද්ධ වාසිය | 610 | 2,881 | (78.83) | 642 | 2,900 | (77.86) |
| වෙනත් මෙහෙයුම් ආදායම | 5,269 | 2,222 | 137.13 | 7,015 | 3,624 | 93.57 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **මුළු මෙහෙයුම් ආදායම** | 65,425 | 56,513 | 15.77 | 69,841 | 60,640 | 15.17 |
| ණය සහ වෙනත් පාඩු සඳහා හානිකරණය (ගාස්තු)/ ප්‍රතිවර්තනය | (7,317) | (7,911) | (7.51) | (7,780) | (7,931) | (1.90) |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම** | 58,108 | 48,602 | 19.56 | 62,061 | 52,709 | 17.74 |
| **මුළු මෙහෙයුම් වියදම්** | (28,013) | (24,260) | 15.47 | (31,804) | (27,635) | 15.09 |
| **එකතු කළ අගය මත බදුවලට (VAT) පෙර මෙහෙයුම් ලාභය** | 30,095 | 24,342 | 23.63 | 30,257 | 25,074 | 20.67 |
| මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු (VAT) | (4,816) | (4,052) | 18.85 | (4,873) | (4,105) | 18.71 |
| **එකතු කළ අගය මත බදුවලින් (VAT) පසු මෙහෙයුම් ලාභය** | 25,279 | 20,290 | 24.58 | 25,384 | 20,969 | 21.05 |
| ආශ්‍රිත සමාගම්වල බදුවලට පෙර ලාභය/ (පාඩුව) කොටස | - | - | - | 107 | 462 | 76.84 |
| **ආදායම් බදුවලට පෙර ලාභය** | 25,279 | 20,290 | 24.58 | 25,491 | 21,431 | 18.94 |
| ආදායම් බදු වියදම | (7,921) | (6,717) | 17.92 | (8,103) | (7,059) | 14.79 |
| **වර්ෂය සඳහා ලාභය** | 17,358 | 13,573 | 27.87 | 17,388 | 14,372 | 20.98 |

සමාලෝචිත වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ රු.මිලියන 2,339 කින් හෙවත් සියයට 8,530 කින් වෙනත් මෙහෙයුම් ආදායම ඇතුළත් විදේශ විනිමය ප්‍රත්‍යාගණනය මත වාසිය වැඩිවීම හා රු.මිලියන 6,765 කින් හෙවත් සියයට 6.3 කින් පොලී ආදායම වැඩිවීමයි.

### 3.1.1 අගය එකතුකිරීමේ ප්‍රකාශනය

| | **2015** රු.මිලියන | **2014** රු.මිලියන |
|---|---|---|
| **අගය එකතු කිරීම** | | |
| බැංකු සේවා සැපයීම මඟින් ඉපයූ ආදායම | 128,078 | 118,513 |
| සේවා පිරිවැය | (55,361) | (59,923) |
| **බැංකු සේවා මඟින් අගය එකතු කිරීම** | 72,717 | 58,590 |
| බැංකු කටයුතු නොවන ආදායම | 4,837 | 8,033 |
| ණය සහ වෙනත් පාඩු සඳහා හානිකරණ ගාස්තු | (7,317) | (7,911) |
| | **70,237** | **58,712** |
| **අගය වෙන්කිරීම** | | |
| සේවකයන්ට | 16,744 | 13,716 |
| රජයට: | | |
| ශ්‍රී ලංකා රජයට ගෙවන ලද ලාභාංශ | 6,346 | 6,846 |
| අධි ලාභ බදු | 2,016 | - |
| ආදායම් බදු | 7,951 | 5,602 |
| එකතු කළ අගය මත බදු | 4,816 | 4,052 |

| | | |
|---|---|---|
| බාහිර අරමුදල් සපයන්නන්ට | 22,008 | 19,462 |
| ව්‍යාප්ත කිරීම හා වර්ධනයට | 10,356 | 9,034 |
| | **70,237** | **58,712** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ රු.මිලියන 58,590 ට සාපේක්ෂව බැංකු සේවා මගින් අගය එකතු කිරීම සියයට 24 ක වර්ධනයක් දක්වමින් රු.මිලියන 72,717 ක් වූ අතර එය 2014 වර්ෂයට සාපේක්ෂව සැලකිය යුතු වර්ධනයක් විය.

(ආ) 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂය තුළදී සේවකයන්ට හා බාහිර අරමුදල් සපයන්නන්ට අගය වෙන්කිරීම පිළිවෙලින් සියයට 22 කින් හා සියයට 13 කින් වැඩි වී තිබුණි.

(ඇ) 2015 වර්ෂය සඳහා බදු වලට පසු ලාභය රු.මිලියන 17,357 ක් වූ අතර එය 2014 වර්ෂයේ වාර්තා කරන ලද රු.මිලියන 13,574 ක බදු වලට පසු ලාභයට සාපේක්ෂව සියයට 27.9 ක වැඩිවීමක් විය. කෙසේ වුවද රජයට ලාභාංශ බෙදාහැරීම 2014 වර්ෂයේ රු.මිලියන 6,846 සිට 2015 වර්ෂයේ රු.මිලියන 6,346 දක්වා සියයට 7 කින් අඩු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

**වැදගත් ගිණුම්කරණ අනුපාත**

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 5 සඳහා වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

(ප්‍රතිශතය)

| | | ශ්‍රී ලං ම බැ ප්‍රතිමාන | 2015 | 2014 | 2013 | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|---|---|---|---|
| (i) | ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (පෙළ 1) | 5.00 | 9.1 | 9.5 | 8.4 | 8.3 | 7.8 | 10.3 |
| (ii) | ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (පෙළ 1+2) | 10.00 | 13.1 | 13.6 | 12.1 | 11.5 | 10.9 | 13.7 |
| (iii) | සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභය | - | 1.7 | 1.6 | 1.4 | 2.1 | 2.1 | 1.6 |
| (iv) | ද්‍රවශීලතා අනුපාතය | 20.00 | 28.2 | 30.8 | 27.7 | 21.8 | 23.4 | 28.7 |
| (v) | සාමාන්‍ය ස්කන්ධය මත ප්‍රතිලාභ | - | 22.2 | 20.5 | 22.2 | 31.2 | 33.5 | 24.0 |
| (vi) | පොලී ආන්තිකය | - | 3.3 | 3.1 | 3.3 | 3.83 | 3.34 | 3.14 |
| (vii) | ආදායමට පිරිවැය අනුපාතය | - | 43.7 | 44.0 | 49.1 | 42.7 | 51.1 | 53.7 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බැංකුවේ සාමාන්‍ය ස්කන්ධය මත ප්‍රතිලාභය 2011 වර්ෂයේ සියයට 33.5 සිට සමාලෝචිත වර්ෂයේ සියයට 22.2 දක්වා ක්‍රමයෙන් අඩු වී තිබුණි. එබැවින් 2011 වර්ෂයේ සිට බැංකුවේ ප්‍රාග්ධනය සම්පත්මය වශයෙන් කළමනාකරණය කර ගැනීම මගින් ප්‍රමාණවත් ප්‍රතිලාභයක් අත්කර ගැනීමට බැංකුව කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. බැංකුවේ සංචිතවල ක්‍රමානුකූල වැඩිවීමක් පැවතියද, 2014

වර්ෂයේදී සිදු කළ ආකාරයට වැඩි වූ ප්‍රාග්ධනය නියමාකාරව ආයෝජනය කිරීම මඟින් 2015 වර්ෂයේදී සාමාන්‍ය ස්කන්ධය මත ප්‍රතිලාභය (R O A E) සඳහා ඉහළ වටිනාකමක් අත්කර ගැනීමට බැංකුව කටයුතු කර නොතිබුණි.

(ii) ශුද්ධ පොලී ආන්තිකය පෙර වර්ෂයේ සියයට 3.1 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සියයට 3.3 දක්වා සුළු වශයෙන් වර්ධනය වී තිබුණි. මේ සඳහා මූලික වශයෙන් මූල්‍ය ආයෝජනවලින් පොලී ආදායම වැඩිවීම, වර්ධනය වූ ණය කළඹ මඟින් කාලීන ණය හා පුද්ගලික ණය සඳහා පොලී ආදායම වැඩිවීම සහ පොලී වියදම සියයට 4 කින් අඩුවීම හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**4.1 ණය පරිපාලනය**

**-------------------**

**(අ) අක්‍රීය ණය හා අත්තිකාරම් (NPA)**

**--------------------------------------**

(i) උකසට තබන ලද ඇපකර පිළිබඳව හා ගනුදෙනුකරුවන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව පිළිබඳව විධිමත් ඇගයීමකින් තොරව ඇතැම් ණය හා අත්තිකාරම් ලබා දී තිබූ බව විගණන නියැදි පරීක්ෂණයේදී අනාවරණය වූ අතර ගනුදෙනුකරුවන්ගේ විගණිත මූල්‍ය ප්‍රකාශන හා ව්‍යාපාර ස්ථාපිත කිරීමට අදාළ නීතිමය ලියකියවිලි කාලීන පදනමින් ලබාගෙන නොතිබුණි. තවද අත්තිකාරම් සඳහා ලිපි ලේඛන ගොනු, අදාළ ලියකියවිලි හා තොරතුරු සමඟ යාවත්කාලීන කර නොතිබුණි. සමහර අවස්ථාවලදී උකසට තබන ලද දේපලවලට අදාළ රක්ෂණ සහතික ලබාගෙන හෝ/ නිසි පරිදි අළුත්කිරීම් කර නොතිබුණි. තවද උකසට තබන ලද දේපල පිළිබඳ ක්‍රමානුකූල පරීක්ෂණයන් සිදු කර නොතිබූ අතර ඇතැම් අවස්ථාවලදී අදාළ ණයකරුවන්ගෙන් නිරවුල් කිරීමේ ලිපි ලබා ගෙන නොතිබුණි.

තවද විවිධ මෙහෙයුම් ක්‍රම යටතේ ගනුදෙනුකරුවන්ට දෙන ලද සියලු පහසුකම් නිරූපනය කරන ස්වයංක්‍රීය මධ්‍යගත වගකීම් වාර්තාවක් ලබා ගැනීම සඳහා බැංකුව සතුව පද්ධතියක් නොවීය. ඒ වෙනුවට ඒකාබද්ධ සර්වග්‍රාහී බැංකු පද්ධතිය (ICBS) සහ කල්බදු හා වෙළඳ මූල්‍ය පද්ධතිය යන විවිධ පද්ධතීන්ගෙන් ලබා ගන්නා වාර්තාවල අනුකූලතාවය කළමනාකරණය විසින් පරීක්ෂා කරයි. ගනුදෙනුකරුවන්ගේ ඒකාබද්ධ ණය අනාවරණය රු.මිලියන 100 ක ප්‍රවේශ ලක්ෂ්‍යයට වඩා සැලකිය යුතු කේවල ණය (Individual Significant Loans) ප්‍රමාණය ඉහළ වුවද, ඇතැම් වැදගත් ගනුදෙනුකරුවන්ගේ මුළු ණය අනාවරණය සැලකිය යුතු කේවල ණය (ISL) ලෙස නිරූපනය නොකෙරෙන බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ii) 2011 වර්ෂයේ සිට 2013 දක්වා වර්ෂ 3 කාලපරිච්ඡේදය සඳහා අක්‍රීය ණය හා අත්තිකාරම් අනුපාතය සියයට 2.1 සිට සියයට 4.3 දක්වා වැඩි වී තිබූ අතර මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ රන් මිල පහත වැටීම නිසා වූ ප්‍රතික්‍රියාව හේතුවෙන් උකස් ණය කළඹේ අක්‍රීය අත්තිකාරම් ප්‍රමාණය ඉහළ යාමයි. තවද ඉහත අක්‍රීය ණය ගිණුමෙන් රු.19,965,835,972 ක වත්කම් ගිණුම්වලට මාරු කිරීමෙන් 2013 වර්ෂයේ සියයට 4.3 සිට 2014 වර්ෂය අවසානයට සියයට 3.8 දක්වා අක්‍රීය ණය අනුපාතය අඩු කරගැනීමට බැංකුවට හැකියාව ලැබී තිබුණි. කෙසේ වුවද 2015 වර්ෂය අවසානයට නැවත වරක් අක්‍රීය ණය අනුපාතය 2014 වර්ෂයට සාපේක්ෂව සියයට 4.3 ක් දක්වා වැඩි වී තිබූ අතර එය සියයට 13.15 ක වැඩිවීමක් විය. අක්‍රීය ණය ප්‍රමාණය ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

(iii) එසේම තෝරාගත් ශාඛා 07 ක් සමාලෝචිත වර්ෂය සඳහා අක්‍රීය ණය අත්තිකාරම් (NPA) ඉහළ ප්‍රතිශතයන් නිරූපනය කර තිබුණි.

(iv)

| ශාඛාවේ නම | මුළු අත්තිකාරම | මුළු අක්‍රීය ණය අත්තිකාරම් | මුළු අත්තිකාරම්වල ප්‍රතිශතයක් ලෙස මුළු අක්‍රීය ණය අත්තිකාරම් |
|---|---|---|---|
| | රු. | රු. | |
| අච්චුවේලි | 776,572,646 | 532,695,076 | 68.60 |
| කෝප්පායි | 405,875,196 | 176,574,934 | 43.50 |
| මාවනැල්ල | 1,982,938,467 | 858,425,824 | 43.29 |
| චුන්නාකම් | 1,216,022,982 | 502,009,515 | 41.28 |
| පෑලියගොඩ මත්ස්‍ය වෙළඳපොළ | 959,485,418 | 324,293,063 | 33.80 |
| කිලිනොච්චි | 972,588,487 | 310,999,353 | 31.98 |
| පස්වෙනි නගර ශාඛාව | 1,187,753,121 | 290,640,646 | 24.47 |

(v) සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රධාන ගනුදෙනුකරුවන් 10 දෙනෙකුගේ ණය හා අත්තිකාරම්වලට අදාළව අක්‍රීය ණය හා අත්තිකාරම් රු.5,044,828,796 ක් විය. විස්තර පහත දැක්වේ.

| ණය හා අත්තිකාරම් වර්ගය | 2015 දෙසැම්බර් 31 දිනට අක්‍රීය මුදල |
|---|---|
| | රු. |
| ණය | 3,669,994,752 |
| බැංකු අයිරා | 994,818,508 |
| බැරපත් (Credit Card) | 11,495,724 |
| කල්බදු | 368,519,812 |
| **එකතුව** | **5,044,828,796** |

(v) ශාඛා 83 ක් ඇතුළත එක් වාරිකයක් හෝ අයකර නොගත් රු.මිලියන 1 කට වැඩි ණය 316 කට අදාළව 2015 දෙසැම්බර් 31 දිනට හිඟ ණය ශේෂ රු.4,929,579,209 ක් විය.

(vi) බැංකු ශාඛා 6 ක් විසින් එම ශාඛා විසින් ලබාදෙන ලද මුළු බැංකු අයිරා පහසුකම්වලට එරෙහිව වැඩිම අක්‍රීය ප්‍රතිශතයන් වාර්තා කර තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට මුළු බැංකු අයිරා ශේෂය රු.1,307,193,267 ක් විය. එදිනට මුළු අක්‍රීය ශේෂය රු.743,558,187 ක් වූ අතර එය සියයට 39.96 සිට සියයට 89.42 ක පරාසයක විය.

| ශාඛාවේ නම | 2015 දෙසැම්බර් 31 දිනට මුළු අයිරා ශේෂය | 2015 දෙසැම්බර් 31 දිනට මුළු අක්‍රීය අයිරා ශේෂය | මුළු අයිරාවල ප්‍රතිශතයක් ලෙස අක්‍රීය අයිරා ශේෂය |
|---|---|---|---|
| | රු. | රු. | |
| පෑලියගොඩ මත්ස්‍ය වෙළඳපොළ | 264,239,930 | 236,290,701 | 89.42 |
| මාවනැල්ල | 149,459,874 | 94,987,349 | 63.55 |

| | | | |
|---|---|---|---|
| පස්වෙනි නගර ශාඛාව | 310,929,933 | 150,993,703 | 48.56 |
| බුලත්සිංහල | 91,960,147 | 44,387,406 | 48.27 |
| මරදාන | 316,397,641 | 147,283,071 | 46.55 |
| කඳුරුවෙල | 174,205,742 | 69,615,957 | 39.96 |
| **එකතුව** | **1,307,193,267** | **743,558,187** | |

(vii) බැංකුවේ කාඩ් මධ්‍යස්ථානය විසින් 2015 දෙසැම්බර් 31 දිනට බැරපත් 80,628 ක් නිකුත් කර තිබූ අතර එදිනට මුළු හිඟ ශේෂය රු.2,861,176,429 ක් විය. මෙයින් රු.162,881,341 ක් එනම් සියයට 5.69 ක් අක්‍රීය ලෙස වර්ගීකරණය කර තිබුණි. එම මුළු අක්‍රීය අත්තිකාරම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| වර්ගය | මුදල |
|---|---|
| | රු. |
| කාලය ඉක්ම වූ | 4,015,861 |
| අපේක්ෂිත මට්ටම නැති | 11,355,294 |
| සැක සහිත | 10,769,335 |
| පාඩු | 136,740,851 |
| එකතුව | **162,881,341** |

(viii) කාඩ්පත් ලබාගත් දින සිට 2015 දෙසැම්බර් 31 දක්වා එක වාරිකයක්වත් නොගෙවූ කාඩ් හිමියන් සංඛ්‍යාව 71 ක් වූ අතර මුළු හිඟ මුදල රු.1,653,083 ක් විය. තවද, සමාලෝචිත වර්ෂය තුළ ලියා හරින ලද ප්‍රාග්ධනය හා පොලිය පිළිවෙලින් රු.20,483,533 ක් හා රු.31,127,582 ක් විය.

**(ආ) බැංකු අයිරා පහසුකම් ලබාදීම**

ගනුදෙනුකරුවකුට මහා භාණ්ඩාගාරයේ ඉල්ලීම මත අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව හදිසි මූල්‍ය වගකීම් ඉටුකර ගැනීම සඳහා 2014 දෙසැම්බර් 15 දින සිට දින 30 ක කාලයක් සඳහා රු.මිලියන 100 ක තාවකාලික අයිරා පහසුකමක් ලබා දී තිබුණි. තවද භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ 2015 ජූනි 25 දිනැති ලිපියෙන් එම තාවකාලික අයිරා (TOD) පහසුකම රු.මිලියන 225 දක්වා වැඩිකරන ලෙස ඉල්ලා තිබුණි. ඒ අනුව 2015 ජූලි 07 දින එම රු.මිලියන 225 ක වැඩි කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබූ අතර 2015 ජූලි 03 දිනැති ලිපියෙන් අයිරා කාල පරිච්ඡේදය තවත් මාස 06 කට දීර්ඝ කර තිබුණි. රු.මිලියන 225 ක මෙම තාවකාලික අයිරා පහසුකම 2015 වර්ෂය අවසානය වන විටත් ලැබිය යුතුව තිබුණි.

**(ඇ) කල්බදු පහසුකම් ලබාදීම**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කල්බදු ව්‍යාපාරවලට අදාළව 2015 දෙසැම්බර් 31 දිනට බැංකුවේ පහත සඳහන් ශාඛා 07 ක් රු.366,379,061 ක ඉහළම අක්‍රීය ණය අත්තිකාරම් වාර්තා කර තිබුණි.

විස්තර පහත දැක්වේ.

| ශාඛාවේ නම | 2015 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ශේෂය | 2015 දෙසැම්බර් 31 දිනට මුළු අක්‍රීය අත්තිකාරම් ශේෂය | මුළු හිඟ ශේෂයේ ප්‍රතිශතයක් ලෙස අක්‍රීය අත්තිකාරම් ශේෂය |
|---|---|---|---|
| | රු. | රු. | |
| දෙහිවල අධි ශ්‍රේණි ශාඛාව | 188,650,508 | 68,834,682 | 36.49 |
| කඩුවෙල | 135,523,771 | 43,451,315 | 32.06 |
| මීරිගම | 78,965,861 | 25,016,384 | 31.68 |
| පැලියගොඩ මත්ස්‍ය වෙළඳපොළ | 159,919,153 | 26,868,987 | 16.80 |
| මාලබේ | 295,565,751 | 41,879,092 | 14.17 |
| කෝපරේට් රිලේෂන්ස් (Corporate Relations) | 561,420,527 | 68,820,405 | 12.26 |
| මෙට්රෝ | 909,984,626 | 91,508,196 | 10.06 |
| **එකතුව** | **2,330,030,197** | **366,379,061** | |

(ii) 2015 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු කල්බදු අනාවරණයෙන් දළ වශයෙන් සියයට 44.5 ක් ශ්‍රී ලංකා රජයට හා රජය සතු අස්ථිත්‍යයන්වලට (SOES) ලබා දී තිබූ ණයවලින් සමන්විත වූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

**(ඇ) උකස් පහසුකම් ලබාදීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2015 දෙසැම්බර් 31 දිනට බැංකුවේ "රන් සුරැකුම් ණය සේවා" කළඹ පහත පරිදි වේ.

| | හිඟ ප්‍රාග්ධනය | ලැබිය යුතු පොලිය |
|---|---|---|
| | රු. | රු. |
| අඛණ්ඩ | 47,863,462,464 | 2,414,330,715 |
| අක්‍රීය | 6,400,536,722 | 1,763,579,051 |

(ii) 2015 දෙසැම්බර් 31 දිනට ශාඛා 176 ක රු.මිලියන 199.3 ක් වූ ව්‍යාජ, කූඨ හා සොරාගත් භාණ්ඩ සහ රු.මිලියන 92.3 ක් වූ (දළ වශයෙන්) උපචිත පොලී නිරීක්ෂණය විය.

**(ඉ) රාජ්‍ය අංශයට ලබාදුන් පහසුකම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) වී අලෙවි මණ්ඩලයට ලබාදුන් රු.බිලියන 5.128 ක පහසුකම**

මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කළ යුතු පහසුකම් සැපයීමේ ලිපියක් පදනම් කරගෙන සමාලෝචිත වර්ෂය තුළ වී මිලදී ගැනීම සඳහා එකතුව රු.බිලියන 5.128 ක ණය මුදලක් බැංකුව විසින් වී අලෙවි මණ්ඩලයට ලබා දී තිබුණි. ගෙවීම් වර්ෂයක් ඇතුළත ලැබිය යුතු අතර පහසුකම් ලිපිය මේ වනතුරුත් මහා භාණ්ඩාගාරයෙන් බැංකුවට ලැබී නොතිබුණි. මේ අතර,

මේ හා සමාන පදනමකින් 2012 වර්ෂයේදී ලබා දී තිබූ රු.බිලියන 3.5 ක ණය මුදලක් ද 2015 දෙසැම්බර් 31 දිනට හිඟව පැවතුණි.

**(ii) පාඩු ලබන රජය සතු ව්‍යාපාරවල හානිකරණ තක්සේරුවේදී සැලකිල්ලට ගත යුතු ඇස්තමේන්තු හා උපකල්පන වලංගුකිරීමේ අවශ්‍යතාවය**

---

2015 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු ණය අනාවරණයෙන් දළ වශයෙන් සියයට 37 ක්, රජය සතු ව්‍යාපාර (SOES) ඇතුළත්ව ශ්‍රී ලංකා රජයට ණයදීම් වලින් සමන්විත විය. හානිකරණ තක්සේරුවේදී ඇතැම් සැලකිය යුතු රජය සතු සමාගම් රජයට අනුයුක්ත ව්‍යාපාර ලෙස යන පදනම මත හානිකරණය නොවූ ලෙස බැංකුව සලකා තිබුණි. එවැනි වැදගත් ප්‍රතිශ්‍ය්‍යාවන් කිහිපයක් පහත දැක්වේ.

| **රජය සතු සමාගමේ නම** | **වැදගත් ප්‍රතිශ්‍ය්‍යාවන්** | | **2015 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ශේෂය** |
|---|---|---|---|
| | | | රු.මිලියන |
| ලංකා ඛනිජ තෙල් සංස්ථාව | එජඩො මිලියන 900 ක භාණ්ඩාගාර ඇපකරය | | |
| | - | ශේෂපත්‍රය මත | 97,689 |
| | - | ශේෂපත්‍රයෙන් පිට | 62,421 |
| වී අලෙවි මණ්ඩලය | සුරක්ෂණය නොකළ ණය ශේෂ | | |
| | - | හිඟ ප්‍රාග්ධනය | 5,128 |
| | - | හිඟ පොලිය | 4,600 |
| සීමාසහිත ලංකා සතොස | සුරක්ෂණය නොකළ ණය ශේෂ (භාණ්ඩාගාර ඇපකර කාලය දීර්ඝ කිරීමෙන් තොරව ආපසු ගෙවීම් කාලය දීර්ඝ කිරීම) | | |
| | - | හිඟ ප්‍රාග්ධනය | 6,992 |
| | - | හිඟ පොලිය | 219 |
| නාගරික සංවර්ධන අධිකාරිය | සුරක්ෂණය නොකළ ණය ශේෂය | | |
| | - | හිඟ ප්‍රාග්ධනය | 11,000 |
| | - | හිඟ පොලිය | 264 |

ණය පැහැර හැරීමකදී පාඩු ලබන ආයතන වෙනුවෙන් ලැබිය යුතු මුදල් නිරවුල් කිරීම සඳහා රජයට ඇති හැකියාව සැලකිල්ලට ගනිමින් කළමනාකරණය විසින් පාඩු ලබන රජය සතු ව්‍යාපාර කෙරෙහි ඇති ප්‍රතිපාර්ශවීය ණය අවදානම විස්තරාත්මකව තක්සේරු කිරීම අවශ්‍ය වේ.

**(ඊ) ණය හා අත්තිකාරම් ලියාහැරීම**

---

පසුගිය වර්ෂ 4 තුළ හිඟ ණය හා අත්තිකාරම්වලට අදාළව ලියාහරින ලද ප්‍රාග්ධනය හා පොලිය පහත දැක්වේ.

| වර්ෂය | 2015 | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|
| ප්‍රාග්ධනය (රු.) | 109,397,125 | 54,690,892 | 102,993,177 | 44,316,750 |
| පොලිය (රු.) | 98,536,345 | 67,615,763 | 247,395,147 | 138,161,976 |
| ලියා හරින ලද මුළු ණය සංඛ්‍යාව | 554 | 424 | 285 | 315 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2015 වර්ෂයේදී ලියා හරින ලද මුළු ප්‍රාග්ධන මුදල රු.109,397,125 ක් වූ අතර බැංකුවේ ගනුදෙනුකරුවන් 554 දෙනෙකුගෙන් එය නියෝජනය විය. කෙසේ වුවද 2015 වර්ෂය තුළ සමාගමක ප්‍රාග්ධන කොටසක් ලෙස රු.55,151,756 ක් බැංකුව විසින් ලියා හැර තිබූ අතර එය 2015 වර්ෂයේ ලියා හරින ලද මුළු ප්‍රාග්ධනයෙන් සියයට 50.41 කින් නියෝජනය විය.

(ii) වෙළඳ නැවක් මිලදී ගැනීම සඳහා එම නැව උකස් කිරීම හා සම්බන්ධිත සමාගමක් විසින් ඉදිරිපත් කරන ලද සංස්ථාමය ඇපයක් මත නැව් සමාගමකට එජඩො මිලියන 1.60 ක කාලීන ණය පහසුකමක් බැංකුව විසින් ලබා දී තිබුණි. 2015 ජූලි 08 දින අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අතිරේක සංදේශයට අනුව, නැව් සමාගමේ මුළු වගකීමෙන් සම්පූර්ණ සහ අවසාන නිරවුල් කිරීම ලෙස රු.මිලියන 75 ක් (එජඩො 531,537.92) භාර ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබූ අතර එකී නැව් සමාගමෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීම සඳහා හෝ නැව පිළිබඳව බැංකුවට ලැබිය යුතු වන්දි ලෙස රක්ෂණ සමාගමෙන් රක්ෂණ හිමිකම ලබා ගැනීම සඳහා නැව අත්අඩංගුවට ගැනීමට කටයුතු කිරීමෙන් තොරව රු.108,015,611 ක් වූ ඉතිරි මුදල ලියා හැර තිබුණි.

## 4.2 බැංකුවේ වෙළඳපොළ කොටස

-----------------------------------

බැංකු අංශයේ වෙළඳපොළ නායකත්වය පිළිබඳ සාපේක්ෂ වැදගත්කම බැංකුව සතුව තිබූ අතර බැංකු අංශයේ අත්කරගෙන තිබූ වෙළඳපොළ කොටස වර්තමාන වෙළඳපොළ තත්ත්වයන් යටතේ පසුගිය වර්ෂ 5 තුළ සුළු වශයෙන් අඩු වී තිබුණි. විස්තර පහත දැක්වේ.

### (අ) ණය සහ අත්තිකාරම්

------------------------

| | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | 2015 | 2014 | 2013 | 2012 | 2011 |
| බැංකුවේ මුළු ණය හා අත්තිකාරම් (රු.මිලියන) | 687,042 | 565,425 | 550,718 | 501,401 | 406,039 |
| වෙළඳපොළේ මුළු ණය හා අත්තිකාරම් (රු.මිලියන) | 3,477,005 | 2,775,708 | 2,546,105 | 2,304,056 | 1,905,682 |
| බැංකුවේ වෙළඳපොළ කොටස (%) | 19.76 | 20.37 | 21.63 | 21.75 | 21.31 |

**(ආ) තැන්පතු**

**----------**

| | වර්ෂය<br>----------<br>**2015** | **2014** | **2013** | **2012** | **2011** |
|---|---|---|---|---|---|
| බැංකුවේ මුළු තැන්පතු ප්‍රමාණය (රු.මිලියන) | 789,877 | 692,371 | 615,059 | 494,901 | 432,070 |
| වෙළඳපොළේ මුළු තැන්පතු ප්‍රමාණය (රු.මිලියන) | 3,772,910 | 3,226,612 | 2,883,661 | 2,450,490 | 2,037,294 |
| බැංකුවේ වෙළඳපොළ කොටස (%) | 20.94 | 21.46 | 21.33 | 20.20 | 21.21 |

**(ඇ) ශ්‍රේණිගත කිරීම (Ratings)**

**------------------------------**

2015 වර්ෂය සඳහා බැංකු අංශයේ ශ්‍රේණිගත කිරීම්හි බැංකුවේ තත්ත්වය පහත පරිදි විය.

**(i) ගෝලීය ශ්‍රේණිගත කිරීම**

**--------------------------**

ෆිච් රේටින්ග්ස් විසින් යූඑස්ඩී ප්‍රධාන සටහන්වල “BB - with stable outlook” යළි සහතික කළ අතර 2015 වර්ෂය තුළ “B1 with stable outlook” මූඩී යළි සහතික කර ඇත. කෙසේ වුවද 2016 මාර්තු මාසයේදී පවුමේ ශ්‍රේණිගත කිරීම සංශෝධනය හේතුවෙන් ෆිච් රේටින්ග්ස් විසින් ලංකා බැංකු ශ්‍රේණිගත කිරීම “BB - stable outlook” සිට “B+ with negative outlook” දක්වා සංශෝධනය කර තිබුණි.

**(ii) දේශීය ශ්‍රේණිගත කිරීම**

**-------------------------**

“AA+ (1ka) with stable outlook” ලෙස ෆිච් රේටින්ග්ස් ලංකා ලිමිටඩ් විසින් බැංකුවේ ශ්‍රේණිගත කිරීම යළි සහතික කර තිබූ අතර 2015 වර්ෂය තුළදී ඉක්රා (ICRA) ලංකා ලිමිටඩ් විසින් (SL) AAA with stable outlook” යළි පවරා තිබුණි.

**4.3 කළමනාකරණ දුර්වලතා**

**--------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) බැංකුවට එරෙහිව පවරන ලද නඩු**

**-----------------------------------**

බැංකුවට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් නඩු 177 ක් ගොනු කර තිබූ අතර ඉන් පුද්ගලයින් තිදෙනෙකු විසින් පවරන ලද නඩු 05 ක් 2015 දෙසැම්බර් 31 දිනට බැංකුවට අවාසි සහගත ලෙස හඳුනාගෙන තිබුණි. නඩු 02 කට අදාළව රු.මිලියන 5.6 ක මුදලක් කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයට වන්දි මුදලක් ලෙස ගෙවීම තහවුරු කරමින් බැංකුවට එරෙහිව තීන්දුව දැනටමත් ලබා දී තිබුණි. මීට අමතරව මුදල් ආපසු අයකර ගැනීමට අදාළව තීන්දුව දිය යුතු වෙනත් අවාසිදායක නඩු තිබූ අතර බැංකුවට එරෙහිව තීන්දුව ලැබුණහොත් රු.මිලියන 171.15 ක වන්දි මුදලක් බාහිර පාර්ශවයන්ට ගෙවීමට සිදුවිය හැක.

**(ආ) ආදායකයාගේ ගිණුමට චෙක්පත් උපලබ්ධි වීම**

**--------------------------------------------------**

නීති, රීති හා බැංකු පරිචයන් සැලකීමෙන් තොරව රේඛනය කළ චෙක්පත් 4 ක් (“රු. 1,001,000 ක මුදලක් ආදායකයාගේ ගිණුමට පමණයි” යනුවෙන් රේඛනය කළ) 2011

වර්ෂයේදී තුන්වන පාර්ශවයන් වෙනුවෙන් බැංකුවේ පුද්ගලික ශාඛාව විසින් උපලබ්ධි කර තිබුණි.

**(ඇ) කල්බදු ගිවිසුම් නොමැතිවීම**

---

කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රජයෙන් ලබාගත් බදු ඉඩම් 22 ක් සඳහා නෛතිකව බැඳුණු බදු දේපොළ ගිවිසුම් බැංකුව සතුව නොතිබුණි. ඇතැම් අවස්ථාවලදී අදාළ අධිකාරීන් විසින් නිකුත් කරන ලද ලිපි වැනි නිල ලියකියවිලි තිබුණු අතර සමහර අවස්ථාවලදී එම බදු දේපළ උපයෝජනය කිරීම සඳහා හිමිකම් තහවුරු කරගැනීමට කිසිදු සාක්ෂියක් බැංකුව සතුව නොතිබුණි.

**(ඈ) ආයුගණක තක්සේරු වාර්තාව පිළිබඳ සුදුසු සමාලෝචන ක්‍රියාවලියක් නොමැති වීම**

---

සේවක ප්‍රතිලාභ සම්බන්ධයෙන් ආයුගණක තක්සේරු වාර්තා සමාලෝචනය කිරීමට සුදුසු සමාලෝචන ක්‍රියාවලියක් බැංකුව සතුව නොතිබුණු බව නිරීක්ෂණය විය. ප්‍රවර්තන වර්ෂයේ ආයුගණක තක්සේරු වාර්තාව සමාලෝචනයේදී, ආයුගණක හා කෙටුම්පත් තක්සේරු වාර්තා ආදියට යවන ලද දත්ත සම්බන්ධයෙන් වෙනස්කම් රාශියක් අනාවරණය වූ අතර එම වෙනස්කම් පසුව නිවැරදි කර තිබුණි.

එබැවින් ආයුගණක තක්සේරුව පිළිබඳ නිරවද්‍යතාවය හා සාධාරණත්වය තහවුරු කරගැනීම සඳහා විධිමත් සමාලෝචන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම කළමනාකරණයේ අත්‍යවශ්‍ය කාරණයක් වේ. ආයුගණක තක්සේරුකරු පත්කිරීමේ ප්‍රමාදය හේතුවෙන් හා ආයුගණක තක්සේරුව සඳහා සාවද්‍ය දත්ත ඉදිරිපත් කිරීම හේතුවෙන් ආයුගණක තක්සේරුව නිම කිරීම වෙහෙසකාරී බවට පත්ව තිබුණි.

**(ඉ) පවත්නා සේවක ප්‍රතිලාභ සැලසුම් සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය**

---

බැංකුවේ පවත්නා සේවක ප්‍රතිලාභ සැලසුම් බැංකුව විසින් සංශෝධනය කළ යුතු අතර අවශ්‍ය පරිදි යළි ව්‍යුහගත කළ යුතු වේ. බැංකුවේ දැනට පවත්නා සේවක ප්‍රතිලාභ සැලසුම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරන ලදී.

(i) 2015 දෙසැම්බර් 31 දිනට බැංකුවේ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම අරමුදලේ සැලසුම් කළ වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබූ අරමුදලේ වගකීම රු.බිලියන 4 කින් ඉක්මවා තිබුණි. (2014 වර්ෂයේදී එය රු.බිලියන 2.8 කි)

(ii) විශ්‍රාමිකයන්ගේ හා වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාමිකයන්ගේ වෛද්‍යාධාර අරමුදල හා ලංකා බැංකු පෝස්ට් 96 විශ්‍රාම වැටුප් අරමුදල (Bank of Ceylon Post 96 Pension) සඳහා භාර ඔප්පු බැංකුව සතුව නොතිබුණි. භාර ඔප්පු නොමැති වීම මෙම සේවක ප්‍රතිලාභ සඳහා අදාළ නෛතික රාමුවක් නොමැති බව පෙන්නුම් කරන අතර මෙම අරමුදල් මෙහෙයුම් කිරීමේදී හා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන්හිදී ව්‍යාකූලත්වයකට හේතු වේ.

**(ඊ) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) චිප් ලයබිලිටි ෂිෆ්ට් (Chip Liability Shift)**

---

2013 මැයි මාසයේදී බැංකුවේ කාර්ය මණ්ඩලයේ සහාය සමඟ සිදුකරන ලද 2013 මැයි 15 දිනැති අංක 05 දරන ගෝලීය ආරක්ෂක තොරතුරු ප්‍රකාශනය අනුව, දේශීය ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) චිප් ලයබිලිටි මාරු කිරීම (Chip Liability Shift) බංගලාදේශය, භූතානය, මාලදිවයින, නේපාලය හා ශ්‍රී ලංකාවේ 2015 ඔක්තෝබර් 16 දින සිට

බලපැවැත්වෙන පරිදි යොදා ගනු ලැබේ. ආරම්භක දැන්වීමට අමතරව, බැංකුවේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා ක්‍රියාත්මක කෙරෙන යූරෝ මාස්ටර් වීසා (EMV) චිප් පත ආරම්භ කිරීම මාස්ටර් කාඩ් ඉල්ලා තිබූ අතර 2015 ඔක්තෝබර් 16 අවසාන දිනයක් දෙමින් බැංකුවේ සියලු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර යූරෝ මාස්ටර් වීසා චිප්පත සඳහා හැකි වන බව තහවුරු කරමින් 2015 වර්ෂය තුළදී මාස්ටර් කාඩ් වෙතින් සිහි කැඳවීම් බොහෝ ගණනක් බැංකුවට ලැබී තිබුණි. චිප් නොමැති තාක්ෂණය වෙනුවට යූරෝ මාස්ටර් වීසා චිප් (EMV Chip) තාක්ෂණය වංචනික ගනුදෙනු අඩු කිරීම සඳහා වඩා ආරක්ෂාකාරී විකල්පයක් ලෙස භාවිතා කළ හැක.

චිප් ලයබිලිටි ෂිෆ්ට් යන අනුකරණය කළ හැකි චුම්බක පටියක් සහිත කාඩ්පත පූර්වෝක්ත දකුණු ආසියාවේ රටවල්වල ඕනෑම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක භාවිතා කළ හැකි වන අතර ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයෙහි යූරෝ මාස්ටර් වීසා චිප්පත භාවිතා කළ නොහැකි වේ නම් බැරකම් අත්කර ගන්නාට මාරු වේ.

ලයබිලිටි ෂිෆ්ට් මත මාස්ටර් කාඩ් දැන්වීම 2015 ඔක්තෝබර් සිදුකිරීමට නියමිතව තිබියදී, බැංකුවේ කිසියම් අවදානම් ජාලයක මෙම අවදානම බැංකුව මේ දක්වා හඳුනාගෙන නොතිබුණි. දැනට මෙම ව්‍යාපෘතිය නිම කෙරෙමින් තිබෙන අතර වංචනික ගනුදෙනු සඳහා වගකීමට බැංකුව විවෘතව පවතී.

**4.4 මතභේදයට තුඩුදෙන කරුණු**

---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) බේරා නොගත් රන් භාණ්ඩ උණු කිරීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ජූනි 18 දිනැති අංක 21 දරන චක්‍රලේඛයෙන් සංශෝධිත, 2010 ජනවාරි 15 දිනැති අංක 46/2010 දරන උකස් අත්තිකාරම් මත සේවා පිළිබඳ කාර්යාල උපදෙස් චක්‍රලේඛයට අනුව, වෙන්දේසිය සඳහා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව නොවිකුණා ඉතිරිවන බේරා නොගත් රන් භාණ්ඩ අතැති රන් භාණ්ඩ ගිණුම (Gold in Hand) නම් ගිණුමකට මාරු කිරීමට ශාඛාවලට උපදෙස් ලබා දී තිබුණි. ඒ අනුව ශාඛාවල උකස් රන් භාණ්ඩ ණය වටිනාකම රු.19,965,835,972 ක් 2014 නොවැම්බර් 30 දිනට අතැති රන් භාණ්ඩ ගිණුමට මාරු කර තිබුණි.

(ii) එසේ මාරු කරන ලද රන් භාණ්ඩවලින් රු.මිලියන 570.38 ක් වටිනා කිලෝග්‍රෑම් 112.62 ක් උණුකර තිබුණු අතර, උණුකළ පසු රන්වල බර ප්‍රමාණය සහ වටිනාකම පිළිවෙලින් කිලෝග්‍රෑම් 111.68 ක් හා රු.මිලියන 451.98 ක් විය. ඒ අනුව, උණු කිරීමේදී රන්වල බර ප්‍රමාණය ග්‍රෑම් 940 කින් හා වටිනාකම රු.මිලියන 118.40 කින් අඩුවීමක් දැක්වුණි.

(vi) 2015 දෙසැම්බර් 30 දින ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන සුරක්ෂිතාගාරයේ සිදුකරන ලද භෞතික පරීක්ෂණයේදී උණුකළ රන් ග්‍රෑම් 37.19 ක ඌනතාවයක් නිරීක්ෂණය විය. සභාපතිවරයාගේ පිළිතුරට අනුව, “තොග පොතෙහි දක්වා ඇති උණු කරන ලද රන් බාර්වල රන් බර ප්‍රමාණය සේවා සපයන්නා විසින් යොදා ගත් බර කිරන යන්ත්‍රවලින් දැක්වෙන සංඛ්‍යා අනුව සටහන් කර ඇත. මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව ක්‍රමාංකනය කිරීමෙන් පසු අලුතින් මිලදී ගත් බර කිරන යන්ත්‍රය උපයෝගී කර ගනිමින් පාරිභෝගික නිෂ්පාදන කළමනාකරණ දෙපාර්තමේන්තුවේ රන් සුරැකුම් ණය සේවා ඒකකය විසින් භෞතික පරීක්ෂණය සිදු කර තිබුණි. සේවා සපයන්නා විසින් බර කිරන යන්ත්‍රය යොදාගෙන වාර්තා කරන ලද බර ප්‍රමාණයට වඩා භෞතික පරීක්ෂණයේදී බර ප්‍රමාණය ග්‍රෑම් 37.19 කින් අඩු වී තිබුණි.

**(iv) ශ්‍රී ලංකා රජයේ හිඟ ආනයන බිල් ගනුදෙනු නිරවුල් කිරීම.**

ඇමරිකානු ඩොලර් 5000 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් මිලදී ගැනීමට අයදුම් කරන සිය ගනුදෙනුකරුවන්ට ලංකා බැංකුව විසින් විශේෂ අනුපාතිකයන් ලබා දෙයි. ගනුදෙනුකරු අයදුම් කරන අවස්ථාවේදී වෙළඳපොලෙහි පවත්නා ඇමරිකානු ඩොලරය සහ රුපියල් විනිමය අනුපාතයට අනුව මෙම විශේෂ අනුපාතිකයන් බැංකුව විසින් තීරණය කරනු ලැබේ. අනුපාතිකය තීරණය කරනු ලබන්නේ වෙළඳපොල විකුණුම් අනුපාතිකයට ශත කිහිපයක් එකතු කිරීමෙනි. (උදා - ශත 10 සිට 25 දක්වා) කෙසේ වුවද බැංකුව විශේෂ අනුපාතිකයන් ඉල්ලා සිටින හොඳම ගනුදෙනුකරුවන්ගෙන් උපයාගත හැකිව තිබූ ලාභය ඉක්මවා ගිය සාධාරණය කළ නොහැකි රු.268,122,303 ක ලාභයක් උපයා ගෙන තිබුණි. ඉහත කරුණු සලකා බලන විට බැංකුවේ ව්‍යාපාරවලට සියයට 40 කට වැඩි ප්‍රමාණයකින් දායකවන ගනුදෙනුකරු හා බැංකුවේ හිමිකරු වශයෙන් ශ්‍රී ලංකා රජයට ඩොලර් මිලියන විශාල ප්‍රමාණයක් වන සිය ගනුදෙනු සඳහා වඩා හොඳ අනුපාතිකයන් ලැබිය යුතුය. කෙසේ වුවද බැංකුවේ ඉහත ගනුදෙනුව තුළින් නුසුදුසු පරිදි මහජන මුදල් ලාභය ලෙස අවශෝෂණය කර ගැනීම පිළිබඳව දැඩි සැලකිල්ල යොමු කළ යුතු කරුණක් වේ.

**4.5 භාණ්ඩාගාර මෙහෙයුම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) 2007 සැප්තැම්බර් 28 දිනැති අංක එස්එස්එස්එස්/04/2007 දරන රාජ්‍ය ණය දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 2.2.2 ඡේදයේ විධිවිධානවලට අනුකූල නොවීම.**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද රෙගුලාසිවලට පටහැනිව, රු.58,686,089,500 ක් වටිනා ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු (REPO) 111 කට අදාළ සුරැකුම්පත්වල නෛතික හිමිකම මාරු කිරීම කඩිනමින් හා නිවැරදිව ලංකා සිකියුර් ඕනර්ෂිප් (Lanka Secure Ownership) මඟින් වාර්තා කිරීමට ලංකා බැංකුව සෘජුව සහභාගීවන අලෙවිකරුවකු වශයෙන් (Dealer Direct Participant) අපොහොසත් වී තිබුණි. ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු (REPO) ප්‍රායෝගිකව පසු ඇගයීමකට ලක් කළ නොහැකි වුවද "සෘජු සහභාගී වන අලෙවිකරු මත ගනුදෙනුව වාර්තා නොකිරීම" යන අවදානමට බැංකුව නිරාවරණය කරමින් භාණ්ඩාගාර අංශය විසින් මෙම පහසුකම එහි ගනුදෙනුකරුවන්ට ලබා දී තිබුණි. එයින් සිදුවිය හැකි අධිභාරය රු.586,860,895 ක් (වාර්තා නොකරන ලද ගනුදෙනු වටිනාකම සියයට 1 ක්) විය හැකිය. එවැනි ගනුදෙනු ලංකා සෙකියුර් හි වාර්තා නොවන බැවින් වාර්තා නොකරන ලද කාලපරිච්ඡේදයට අදාළ ඕනෑම ගනුදෙනුවක් සුරැකුම් නොකරන ලද මූල්‍ය වෙළඳපොල ගනුදෙනු ලෙස සැලකිය හැකිය.

**(ආ) විදේශ විනිමය තත්ත්වය ශ්‍රී ලංකා මහ බැංකුවට වාර්තා කිරීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබීය.

(i) වර්තමානයේදී ව්‍යාපාර ඒකක වලින් දුරකථනය මඟින් ලබා ගන්නා සංඛ්‍යා මත පදනම්ව බැංකුව එහි දිනය අවසානයේ විදේශ විනිමය තත්ත්වය ගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විවෘත තත්ත්ව සීමාවට (Net Open Position Limit) අනුකූල වීම සඳහා ජාත්‍යන්තර අරමුදල් කළමනාකරණයට (International Fund Management Desk) අනුයුක්ත අලෙවිකරුවන් දිනය අවසානයේ එම තත්ත්වයන් ආවරණය කරයි. කෙසේ වුවද විදේශ විනිමය වත්කම් හා වගකීම් පරීක්ෂා කිරීම මඟින් විදේශ මුදල් ශේෂපත්‍රය පදනම්ව බැංකුව එහි විදේශ විනිමය අනාවරණය පසු දින ආරම්භයේදී බැංකුව යළි ගණනය කරන බව විගණනයේදී

නිරීක්ෂණය විය. ඇතැම් අවස්ථාවලදී, විදේශ විනිමය වත්කම් සහ වගකීම්වල පෙර දින අතින් ගණනය කරන ලද සංඛ්‍යා සමඟ එජ ඩොලර් මිලියන ගණන් වටිනා වෙනස්කම් නිරීක්ෂණය විය. මේ සඳහා විකල්ප ක්‍රියාමාර්ගයක් නොවූ බැවින් ඒකාබද්ධ විස්තරාත්මක බැංකු පද්ධතියෙන් (Integrated Comprehensive Banking System) ජනනය වන විදේශ විනිමය තත්ත්වය බැංකුව විසින් හඳුනා ගනු ලැබේ. විදේශ විනිමය අනාවරණය කළමනාකරණය කිරීම සඳහා වගකිව යුතු අධිකාරිය වන භාණ්ඩාගාර අංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය විසින් එහි වෙළඳපොළ අවදානම අවම කරගැනීම සඳහා සහ නීත්‍යානුකූල වාර්තාකරණ පරිපාටියක් පිළිපැදීම සඳහා විදේශ විනිමය තත්ත්වය හඳුනා ගැනීමට, පිළිගැනීමට හා එහි සත්‍ය තත්ත්වය නිවැරදිව වාර්තා කිරීමට අපොහොසත් වී තිබුණු බව ඉහත නිරීක්ෂණය අනුව අනාවරණය විය. එබැවින් බැංකුව විශාල වෙළඳපොළ අවදානමකට හා අනුකූල නොවීමේ අවදානමකට ලක් වී ඇත.

තවද නියැදි විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය වූ පහත සඳහන් වෙනස්කම් පිළිබඳව පැහැදිලි කිරීමට කළමනාකරණයට නොහැකි වී තිබුණි. (එජ ඩොලර් පමණක්)

| දිනය | අතින් ගණනය කිරීම් අනුව දිනය අවසානයේ තත්ත්වය | ඒකාබද්ධ විස්තරාත්මක බැංකු පද්ධතිය අනුව දිනය අවසානයේ තත්ත්වය | වෙනස |
|---|---|---|---|
| | එජඩො | එජඩො | එජඩො |
| 01.10.2015 | 2,597,324 | (144,767) | 2,452,557 |
| 02.10.2015 | (5,841,421) | 37,587 | (5,803,834) |
| 07.10.2015 | (2,830,285) | 585,004 | (2,245,281) |
| 08.10.2015 | (1,678,006) | 5,506,184 | 3,828,178 |
| 09.10.2015 | (1,261,640) | 3,926,988 | 2,665,348 |
| 12.10.2015 | (1,933,534) | 175,249 | (1,758,285) |
| 14.10.2015 | 1,041,757 | 15,664 | 1,026,093 |
| 16.10.2015 | (653,363) | (1,620,253) | (2,273,616) |
| 21.10.2015 | 2,438,469 | 3,639,165 | 6,077,634 |
| 22.10.2015 | 3,861,934 | 1,782,516 | 5,644,450 |
| 28.10.2015 | (370,387) | 1,605,609 | 1,235,222 |
| 29.10.2015 | (3,136,407) | 808,710 | (2,327,697) |
| 30.10.2015 | 46,506 | (2,574,982) | (2,528,476) |

(ii) අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා අලෙවිකරණ කටයුතුවලින් නිදහස් නිලධාරියෙකු විසින් විදේශ විනිමය අනාවරණය ගණනය කිරීම හා මහ බැංකුවට

වාර්තා කිරීම සිදු කළ යුතුය. කෙසේ වුවද අලෙවිකරණ කාමරයට අනුයුක්ත සහකාර අලෙවි නිලධාරියකු විසින් මෙම කාර්යය තවමත් සිදු කරන බව නිරීක්ෂණය විය.

**(ඈ) 2002 මැයි 02 දිනැති ප්‍රතිමිලදී ගැනුම් හා ප්‍රතිවර්තන ප්‍රතිමිලදී ගැනුම් පිළිබඳ නියෝගයට අනුකූල නොවීම.**

---

ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ඉහත නියෝගය අනුව, ප්‍රතිමිලදී ගැනුම්වලට එරෙහි ණය ගැනුම් සඳහා ප්‍රමාණවත් සුරකුම් වෙන් කළ යුතුය. කෙසේ වුවද ගනුදෙනුවල වෙළඳපොළ අගය ආවරණය කිරීමට හා ඉහත නියෝගය උල්ලංඝනය නොකිරීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට සුරකුම් පහත සඳහන් ගනුදෙනු වලදී වෙන්කර නොතිබුණි.

| අලෙවි කිරීම් දිනය | අලෙවි කිරීම් අංකය | ප්‍රතිපාර්ශවය | ප්‍රාග්ධනය + උපචිත පොලිය | සුරකුම්පත්වල වෙළඳපොළ අගය | ඌන වෙන්කිරීම |
|---|---|---|---|---|---|
| | | | රු. | රු. | රු. |
| ලැබී නොමැත | ලැබී නොමැත | නිවාස සංවර්ධන අරමුදල | 61,064,178 | 56,803,521 | 4,260,657 |
| ලැබී නොමැත | ලැබී නොමැත | තැපැල් කාර්යාලීය සුරකුම් අරමුදල | 43,937,552 | 41,895,490 | 2,042,062 |

**(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව (ශ්‍රී ලං ම බැ) 2015 පෙබරවාරි 27 දින භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම.**

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2015 පෙබරවාරි 27 දින පැවති භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිය මත කල්පිරීම් කාලපරිච්ඡේදය වර්ෂ 30 ක් සහිත භාණ්ඩාගාර බැඳුම්කර සම්බන්ධයෙන් ලංකා බැංකුවේ (BOC) ප්‍රාථමික ගනුදෙනුකරු ඒකකය විසින් ඉදිරිපත් කරන ලද ලංසු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ගනුදෙනුකරු | අනුපාතය | මුහුණත අගය | ශ්‍රී ල ම බැ අපේක්ෂිත මුදල |
|---|---|---|---|
| | (%) | රු.මිලියන | රු.මිලියන |
| 1. කළුතර බෝධි භාරය | 9.35 | 8 | 8 |
| 2. සෙලින්කෝ ජීවිත රක්ෂණය | 10.25 | 500 | 500 |
| 3. සීමාසහිත පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම | 12.50 | 3,000 | 3,000 |
| 4. සීමාසහිත පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම | 12.75 | 5,000 | අසාර්ථක විය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 5. | සීමාසහිත පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම | 13.00 | 5,000 | අසාර්ථක විය. |
| | **එකතුව** | | 13,508 | |

(ii) භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසියකදී වෙනත් ප්‍රාථමික ගනුදෙනුකරුවකු වෙනුවෙන් පළමු වතාවට ලංසුවක් ඉදිරිපත් කිරීම සඳහා ලංකා බැංකුව විසින් ඉල්ලීමක් කර තිබුණි. උදා - 2015 පෙබරවාරි 27 දින භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිය සීමාසහිත පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම වෙනුවෙන්.

(iii) බැංකුවේ භාණ්ඩාගාර අංශය විසින් ප්‍රසිද්ධ බැංකුවලින් හා ප්‍රාථමික ගනුදෙනුකරුවන්ගෙන් වෙන් වශයෙන් "ගනුදෙනුකරු හඳුනාගන්න" (Know Your Customer) යන ආකෘති ලබා ගෙන නොතිබුණි.

පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීම්වලට පසු සිදුකරන ලද විගණන නියැදි පරීක්ෂණයන්හිදී පහත කරුණු නිරීක්ෂණය විය.

* බැංකුවේ ආයතන අංශය විසින් සීමාසහිත පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ නමට ජංගම ගිණුම් දෙකක් පවත්වාගෙන යන අතර නිසි කැපවීම පරීක්ෂා කිරීමට මෙම ගිණුම් සඳහා බැංකුව විසින් ගනුදෙනුකරු හඳුනාගන්න (KYC) ආකෘති ලබාගෙන තිබුණි.

* 2014 හා 2015 වර්ෂ තුළදී රු.බිලියන 106 ක් වූ ප්‍රතිවර්තන ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු (Reverse Repo Transactions) සඳහා බැංකුව එළඹ තිබූ අතර එම ගනුදෙනු ආවරණය කිරීම සඳහා එම සමාගම සමඟ බැංකුව විසින් "ප්‍රධාන ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුමක්" (Master Repo Agreement) අත්සන් කර තිබූ බවද තවදුරටත් අනාවරණය විය.

(iv) ලංකා බැංකුවේ භාණ්ඩාගාර මෙහෙයුම් අත්පොතේ 6 වගන්තිය අනුව, අරමුදල් පරීක්ෂා කිරීම, අත්සන් හා අනෙකුත් අත්‍යවශ්‍ය දත්ත පරීක්ෂා කිරීමෙන් තොරව ප්‍රාථමික ගනුදෙනුකරු ඒකකය විසින් ඉල්ලුම්පත් ක්‍රියාවලිය සිදු නොකළ යුතුය. ඔවුන් විසින් විශේෂයෙන් මුදල් ගනුදෙනු පිළිබඳව "ගනුදෙනුකරු හඳුනා ගන්න" (KYC Guidelines) මාර්ගෝපදේශ පිළිපැදිය යුතුය. එහෙත් ඉහත උපදෙස්වලට පටහැනිව, එවැනි සාර්ථක ලංසු අවස්ථාවකදී ලංසු නිරවුල් කිරීමට ප්‍රමාණවත් මුදල් සීමාසහිත පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමට නොතිබූ බව ප්‍රාථමික ගනුදෙනුකරු ඒකකය විසින් දැන ගෙන තිබුණි.

පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීම්වලින් පසුව සිදුකරන ලද විස්තරාත්මක විගණනයන්හිදී පහත සඳහන් කරුණු අනාවරණය විය.

වෙනත් බැංකු, ප්‍රධාන ප්‍රසිද්ධ සංස්ථා හා ප්‍රාථමික ගනුදෙනුකරුවන් වෙනුවෙන් ප්‍රාථමික ලංසු කැඳවීම සඳහා ලිඛිත පරිපාටියක් බැංකුවට නොතිබුණි. 2015 පෙබරවාරි 27 දින සිදු කරන ලද මතභේදාත්මක බැඳුම්කර නිකුතුවෙන් පසු " ප්‍රාථමික වෙන්දේසි ලංසු කිරීම, රජයේ සුරැකුම්පත්වලට එරෙහි "SWAP" ගනුදෙනු හා ප්‍රතිවර්තන ප්‍රතිමිලදී ගැනුම්/ රජයේ සුරැකුම්පත් මඟින් ආයෝජන සඳහා සකස් කරන ලද පරිපාටි" යටතේ 2015 සැප්තැම්බර් 07 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් මඟින් මෙම ආකාරයේ ලංසු කැඳවීම සඳහා අනුගමනය කළ යුතු පරිපාටි හඳුන්වා දී තිබුණි. සෘජු ප්‍රාථමික ලංසුකරුවන් සඳහා අරමුදල් පරීක්ෂා කිරීමේ ක්‍රමවේදය හඳුන්වා දී තිබුණේ 2015 සැප්තැම්බර් 07 දිනැති ඉහත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ 3 වගන්තියෙන් බව තවදුරටත් නිරීක්ෂණය විය.

(v) දෙවැනි ගනුදෙනුව SWAP ගනුදෙනුවක් වූ අතර එහිදී ලංකා බැංකුව විසින් රු.බිලියන 2.3 ක් වටිනා බැඳුම්කර 2015 මාර්තු 2 දින සීමාසහිත පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමෙන් සියයට 12.50 ක රේටයකට මිලදී ගෙන එම බැඳුම්කරය 2015 මාර්තු 6 දින සියයට 12.4950 රේටයකට විකුණා තිබුණි. 2015 මාර්තු 2 දින පස්වරු 3.26 ට රු.බිලියන 1 ක් වටිනා බැඳුම්කර සීමාසහිත පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම විසින් පළමුවෙන් නිරවුල් කර තිබුණු බව කමිටුව තවදුරටත් නිරීක්ෂණය කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවට අනුව, වෙන්දේසියෙන් තවත් රු.බිලියන 2 ක් වටිනා බැඳුම්කර සීමාසහිත පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමට ලැබී තිබුණි. එබැවින් "SWAP" පදනම යටතේ එකඟ වූ ගනුදෙනුව නිරවුල් කිරීම සඳහා ඔවුන්ට ප්‍රමාණවත් සුරැකුම්පත් තිබුණි. (බැඳුම්කරය ලංකා බැංකුවට විකිණීම සඳහා) ඉන්පසු, රු.බිලියන 2 ක හිඟ ශේෂය (වෙන්දේසිය මඟින් ලංකා බැංකුවෙන් මිලදී ගත්) ඔවුන් විසින් එදිනම ලංකා බැංකුවට නිරවුල් කර තිබුණි.

පසුව, සීමාසහිත පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම "SWAP" ගනුදෙනුව අවසන් කර ලංකා බැංකුවෙන් රු.බිලියන 2.3 ක් වටිනා බැඳුම්කර මිලදී ගෙන තිබුණි. ලංකා බැංකුව එම ගනුදෙනුවෙන් රු.මිලියන 3.9 ක් වූ වාසියක් ලබාගෙන තිබුණි.

(vi) 2015 පෙබරවාරි 27 දින පවත්වන ලද ශ්‍රී ලංකා මහ බැංකු ලංසු වෙන්දේසිය සඳහා පෙරවරු 11.30 දක්වා කාලය දීර්ඝ කිරීම පිළිබඳ ලිඛිත සාක්ෂියක් නොතිබුණි. එයට එකඟ වී තිබුණේ දූරකථන සාකච්ඡා මඟිනි. ශ්‍රී ලංකා මහ බැංකු ලංසු මුද්‍රිත ප්‍රකාශනයට අනුව, වෙන්දේසි වේලාව පෙරවරු 11.10 දක්වා දීර්ඝ කර තිබුණි.

(vii) ප්‍රාථමික ගනුදෙනුකරුට (සීමාසහිත පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම) අනුව, ඔවුන් රක්ෂණ සමාගමක් වෙනුවෙන් ලංසු කිරීම සිදුකර ඇති බව දන්වා තිබුණි. කෙසේ වුවද මෙම ප්‍රකාශනය තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂියක් ඔවුන්ට ඉදිරිපත් කිරීමට නොහැකි වී තිබුණි. සීමාසහිත පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම විසින් මිලදී ගන්නා ලද මෙම බැඳුම්කර කිසිදිනෙක ද්විතීය වෙළඳපොලේ රක්ෂණ සමාගමකට නොවිකුණු බවටද තහවුරු වී තිබුණි.

**4.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**--------------------------------**

**විදේශ ශාඛාවල මෙහෙයුම්**

**-------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) සීමාසහිත ලංකා බැංකුව (එක්සත් රාජධානිය)**

සීමාසහිත ලංකා බැංකුව (එක්සත් රාජධානිය) බැංකුවේ සම්පූර්ණ අයිතිය සතු පරිපාලිතයකි. 2015 දෙසැම්බර් 31 දිනට ආයෝජන පිරිවැය රු.මිලියන 2,684 ක් විය. කෙසේ වුවද පරිපාලිතයේ ලාභදායීත්වය පහත සඳහන් පරිදි අඛණ්ඩව පිරිහී තිබුණි.

| **කාලපරිච්ඡේදය** | **බදු වලට පසු ශුද්ධ ලාභය/ (පාඩුව)** | **බදු වලට පසු ශුද්ධ ලාභය/ (පාඩුව)** |
|---|---|---|
| | මුදල බ්‍රිතාන්‍ය පවුම්වලින් | මුදල රුපියල් වලින් |
| 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 8 ක කාලපරිච්ඡේදය | (89,272) | (15,373,531) |
| 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් | (414,108) | (73,541,440) |

වර්ෂය

| | | |
|---|---|---|
| 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | (221,000) | (45,459,700) |
| 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | (422,000) | (91,092,920) |
| 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | (596,000) | (122,031,000) |
| 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | (312,293) | (66,697,089) |

පාඩුව වැඩිවීම හේතුවෙන් පරිපාලිතය එහි ආරම්භය වූ 2010 වර්ෂයේ සිටම ලාභාංශ ගෙවීම සඳහා හැකි තත්ත්වයක නොතිබුණි.

**(ආ) බැංකුවේ සීෂෙල්ස් ශාඛාව**

**තැන්පතු**

2015 දෙසැම්බර් 31 දිනට සීෂෙල්ස් ශාඛාවේ පවත්වාගෙන ගිය මුළු ගනුදෙනුකරු ගිණුම් සංඛ්‍යාව 811 ක් විය. මුළු ගිණුම්වලින් ගිණුම් 176 ක් ශුන්‍ය ශේෂයක් සහිතව පවත්වා ගෙන යන අතර එය මුළු ගිණුම් සංඛ්‍යාවෙන් සියයට 22 කින් නියෝජනය විය. විස්තර පහත දැක්වේ.

| ගිණුම් විස්තරය | මුළු ගිණුම් සංඛ්‍යාව | ශුන්‍ය ශේෂයක් සහිත ගිණුම් සංඛ්‍යාව |
|---|---|---|
| ඉතිරිකිරීමේ ගිණුම් | 598 | 141 |
| ජංගම ගිණුම් | 210 | 35 |
| ස්ථාවර තැන්පතු | 03 | - |
| එකතුව | 811 | 176 |

**(i) නිකුත් කළ අරමුදල්වල ප්‍රාග්ධන පිරිවැය**

බැංකුව විසින් එජඩො මිලියන 1.5 ක ණය පහසුකමක් මාස 6 ක ලන්ඩන් ඉන්ටර් බැන්ක් ඔෆර්ඩ් රේටයට (London Interbank Offered Rate) සියයට 4 ක් එකතු කර 2015 සැප්තැම්බර් 25 දින සීෂෙල්ස් ශාඛාවට ලබා දී තිබුණි. කෙසේ වුවද, එම දිනයටම බැංකුවේ බර තැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය එජඩො වලින් සියයට 4.83 ක් බවට තක්සේරු කර තිබුණි. බැංකුවේ සභාපතිට අනුව, "මෙය වාණිජ පදනමක් මත දුන් ව්‍යාපාර ණය මුදලක් නොවන අතර සීෂෙල්ස් ශාඛාව විසින් සියයට 8-12 අතර රේටයන්ට ණයට දෙන බවත් එම ශාඛාවට ණයට දුන් එජඩො අරමුදල් මත බැංකුවට සමස්ත ඉපැයීමක් තිබූ බවත් දන්වා තිබුණි."

**(ii) ගනුදෙනුකරුවන්ගෙන් තැන්පතු**

තැන්පතු පිළිබඳව කරන ලද සමාලෝචනයේදී, බැංකුවේ මුළු තැන්පතුවලින් සියයට 73 ක් අයත් ප්‍රධාන තැන්පතුකරුවන් 10 දෙනෙක් 2015 දෙසැම්බර් 31 දිනට සිටින බව නිරීක්ෂණය විය. මෙයින් පෙනීයන්නේ ඉතා සීමිත තැන්පතුකරුවන් සංඛ්‍යාවක් මත ශාඛාව වඩාත් යැපෙන බවත් ඉතා ඉහළ අවදානමකට අනාවරණය වී ඇති

බවත්ය. එබැවින් ශාඛාවේ අඛණ්ඩ පැවැත්ම සඳහා මෙම තත්ත්වය ඉතා අහිතකර ලෙස බලපානු ඇති බවට නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු බැංකුවේ සභාපති වෙත නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තා මඟින් බැංකුවේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයක් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

(අ) ණය පරිපාලනය - අක්‍රීය අත්තිකාරම් අනුපාතය

- ඉහළ අක්‍රීය ගනුදෙනුකරුවන් හා ශාඛා.

- ලියා හල ණය

(ආ) ප්‍රථමික ගනුදෙනු ඒකකය - අනුකූල නොවීම්.

- විදේශ විනිමය තත්ත්වයන්

(ඇ) විදේශ ශාඛා - පාඩු ලබන විදේශ ශාඛා

- තැන්පත්කරුවන් සුළු සංඛ්‍යාවක් මත යැපීම.